
# පුරවැසි අධ්‍යාපනය

8 ශ්‍රේණිය - මොඩියුල 01

සියලු හිමිකම් ඇවිරිණි

ප්‍රථම මුද්‍රණය :- 2023



# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා

ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා

අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා

පිළිගනු මැන අප භක්ති පූජා

නමෝ නමෝ මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා

ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති

ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ

ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ

නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා

ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා

එක මවකගෙ දරු කැල බැවිනා

යමු යමු වී නොපමා

ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

# පෙරවදන

## නියාමනය හා අධීක්ෂණය

| | |
|---|---|
| ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න | අධ්‍යක්ෂ ජනරාල්,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| ආචාර්ය දර්ශන සමරවීර | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,<br>භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාපීඨය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |

## මෙහෙයවීම හා සම්බන්ධීකරණය

| | |
|---|---|
| එස්. යූ. අයි. කේ. ද සිල්වා මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>පුරවැසි අධ්‍යාපනය,(විෂය ව්‍යාපෘති ප්‍රධානි)<br>ජාතික අධ්‍යාපන ආයතනය |

## සංස්කාරක මණ්ඩලය

| | |
|---|---|
| 1. එස්. යූ. අයි. කේ. ද සිල්වා මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>පුරවැසි අධ්‍යාපනය,(විෂය ව්‍යාපෘති ප්‍රධානි),<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| 2. කේ. ජී. කේ. ප්‍රභාෂ් මයා | සහකාර කථිකාචාර්ය,<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| 3. ආචාර්ය කේ. ඒ. එන් පුෂ්පකුමාර | කථිකාචාර්ය,<br>ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය,<br>පතන |
| 4. එල්. එම්. වංශවතී මිය | පීඨාධිපති (විශ්‍රාමික),<br>වයඹ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය,<br>බිංගිරිය |
| 5. අයේෂා පතිරාජ මිය | කථිකාචාර්ය,<br>ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය,<br>පම්බල, කාක්කපල්ලිය |

## ලේඛක මණ්ඩලය

1. පී. ටී. මාරසිංහ මිය — සහකාර විදුහල්පති,
බප/ ජය/ ජනාධිපති බාලිකා විද්‍යාලය,
නාවල.

2. ටී ඩී. එන්. අයි. තිලකරත්න මයා — ගුරු සේවය,
බ/ කළුබුළුලන්ද මහා විද්‍යාලය,
වැලිමඩ.

3. ආර්. එස්. කේ. කේ. ධර්මසිරි මිය — ගුරු සේවය,
බප/ජය ශ්‍රී සෝමානන්ද මහා විද්‍යාලය,
කොරතොට.

4. පී. ප්‍රේමනාදන් මයා — ගුරු සේවය,
කෑ/ ශාන්ත මේරි දෙමළ මහා විද්‍යාලය,
යටියන්තොට.

5. එස්. එස්. ඇල්විටිගල මෙනවිය — ගුරු සේවය,
බප/ ජය/ ශාන්ත තෝමස් විද්‍යාලය,
කෝට්ටේ.

6. බි. ප්‍රේම්ලන් මයා — ගුරු සේවය,
මඩ/ පිඩි/ කල්මුණේ පාලමුරුගන්,
දෙමළ මහා විද්‍යාලය, මන්දූර්.

7. කසුන් පුෂ්පික තලගල මයා — ගුරු සේවය,
බප/ජය ශ්‍රී සෝමානන්ද මහා විද්‍යාලය,
කොරතොට.

## සිංහල භාෂා සංස්කරණය

## පිටකවර හා චිත්‍ර රූප සටහන්

කසුන් පුෂ්පික තලගල මයා — ගුරු සේවය,
බප/ජය ශ්‍රී සෝමානන්ද මහා විද්‍යාලය,
කොරතොට.

# ක්‍රියාකාරකම් පෙළගැස්ම

**ක්‍රියාකාරකම 01**
**සංස්කෘතික විවිධත්වය හඳුනා ගනිමු** 04

**ක්‍රියාකාරකම 02**
**විවිධ සංස්කෘතීන් දැන ගනිමු සහයෝගයෙන් දිවි ගෙවමු** 12

**ක්‍රියාකාරකම 03**
**සංස්කෘතික දායාද සුරකිමු** 22

**ක්‍රියාකාරකම 04**
**සමාජ වගකීම් ඉටු කරමු** 30

**ක්‍රියාකාරකම 05**
**බහු සංස්කෘතිය අගයමින් වැඩ ලෝකයට පිය නගමු** 37

**ක්‍රියාකාරකම 06**
**21 වන සියවසට ඔබින වැඩ ලෝකයට අනුගත වෙමු** 51

# ආදරණීය දුවේ පුතේ....

21වන සියවසට උචිත පුරවැසි දැනුම, පුරවැසි ආකල්ප සහ පුරවැසි කුසලතා සංවර්ධනය කර ගැනීම උදෙසා මෙම මොඩියුලයේ ඇතුළත් ක්‍රියාකාරකම් ස්වයංව ද, සාමූහිකව ද, ඉතා කැමැත්තෙන් මෙන්ම අවංකව ඉටු කිරීමට අධිෂ්ඨානශීලීව ක්‍රියා කරමි.




**මෙම මොඩියුලය සුරක්ෂිතව පරිහරණය කරමින් ඉදිරි වසර වලදී ද ඔබේම සහෝදර සහෝදරියන්ට ප්‍රයෝජනයට ගත හැකිවන පරිදි කටයුතු කරන්න.**



## මෙම මොඩියුලය අවසානයේ දී මා අත්පත් කරගන්නා දෑ

- විවිධත්වයෙන් යුක්ත මූලික අංග ගණනාවක සමෝධානිත එකතුවක් ලෙස සංස්කෘතිය ගොඩ නැගී ඇති ආකාරය විග්‍රහ කිරීම
- පුරවැසියකු වශයෙන් සංස්කෘතික විවිධත්වයට අනුගතව එම උරුම සහ දායාද සුරැකීම
- සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම හා සබැඳි පුරවැසියකු සතු වගකීම් විමර්ශනය කිරීම
- සමාජයේ සාමාජිකයකු ලෙස සෑම පුද්ගලයකු විසින්ම ඉටු කල යුතු සමාජ වගකීම් ඉටු කිරීම
- පුරවැසියකු ලෙස සමාජ වගකීම් ඉටු කිරීමේ වැදගත්කම අගය කිරීම
- පාසල් ශිෂ්‍යයකු ලෙස පාසලට, පවුලට සහ පොදු සමාජයට අදාලව සමාජ වගකීම් ඉටු කිරීම
- බහු සංස්කෘතික සමාජයක සාමාජිකයෙකු ලෙස වගකීම් සහගතව රැකියාවේ නිරත වීම සඳහා අතවශ්‍ය මූලික ගුණාංග ප්‍රගුණ කිරීම
- 21 වන සියවසට ඔබින වැඩ ලෝකය හා සැබැඳි කුසලතා සංවර්ධනයට කැමැත්ත පළ කිරීම
- වැඩ ලෝකයට සාර්ථකව අනුගත වීම සඳහා ස්වයං ගොනුවක අඛණ්ඩව සහ යාවත්කාලීනව පවත්වා ගැනීමට ක්‍රියා කිරීම





# ක්‍රියාකාරකම 01
# සංස්කෘතික විවිධත්වය හඳුනා ගනිමු

අපේක්ෂිත කුසලතාව : විවිධත්වයෙන් යුක්ත මූලික අංග ගණනාවක එකතුවක් ලෙස සංස්කෘතිය ගොඩනැගී ඇති ආකාරය විග්‍රහ කිරීම

කාලය : පැය 1 යි



## මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා අත්පත් කරගන්නා දෑ

- සංස්කෘතිය යන්න මූලික අංග ගණනාවක එකතුවක් ලෙස හඳුනා ගැනීම
- සංස්කෘතික විවිධත්වයට බලපාන විවිධ හේතු සාධක විමර්ශනය කිරීම
- විවිධ සංස්කෘතීන්වලට අයත් පුද්ගලයින් එකම සමාජයක ජීවත්වන බව හඳුනා ගැනීම











## පෙර දැනුම පිරික්සීම

ශ්‍රී ලංකාවේ ජීවත්වන ජනවර්ග

..........................................................................................

..........................................................................................

..........................................................................................

ඔවුන් අදහන ආගම්

..........................................................................................

..........................................................................................

..........................................................................................

එම ජනවර්ගවලට අයත් පුද්ගලයින් ව්‍යවහාර කරනු ලබන භාෂා

..........................................................................................

..........................................................................................

..........................................................................................

ඉහත සියලුම අංගයන්හී එකතුව හැඳින්වීමට යොදා ගත හැකි පොදු නාමය

..........................................................................................

..........................................................................................









ඔබේ පිළිතුරු පාදක කර ගනිමින් ශ්‍රී ලංකාවේ සංස්කෘතියේ ස්වභාවය තවදුරටත් හඳුනා ගනිමු








## පොදු උපදෙස්

- ක්‍රියාකාරකම ආරම්භ කිරීමට ප්‍රථම ඔබේ ගුරුතුමාගේ / ගුරුතුමියගේ උපදෙස් අනුව සංස්කෘතිය පිළිබඳ පහත අංග ඔස්සේ බුද්ධි කලම්භන සාකච්ඡාවක යෙදෙන්න
    - සංස්කෘතිය හඳුනා ගැනීම
    - සංස්කෘතික අංග
    - සංස්කෘතික විවිධත්වය
    - සංස්කෘතික විවිධත්වයට හේතු

බුද්ධිකලම්භන සාකච්ඡාවෙන් මා හඳුනා ගත් ආකාරයට සංස්කෘතිය යනු

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................


..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................


..........................................................................................................





සංස්කෘතික අංග නිරූපණය කිරීම සඳහා මා විසින් සපයා ගත් පින්තූර/ අඳින ලද චිත්‍ර කිහිපයක්.........

**සංස්කෘතිය මූලික අංග ගණනාවක එකතුවකි**
**ඒ අනුව සංස්කෘතියට අයත් වන අංග වනුයේ**






**ශ්‍රී ලාංකික ජන සමාජය පිළිබඳ පහත සටහන හොඳින් අධ්‍යයනය කර කණ්ඩායම් ක්‍රියාකාරකම සඳහා සූදානම් වන්න.**

යම් ජනසමාජයක විවිධ සංස්කෘතීන්ට අයත් පුද්ගලයින් නියෝජනය වීම සංස්කෘතික විවිධත්වය ලෙස හැඳින්විය හැක. ලෝකයේ සෑම රටකම සංස්කෘතික විවිධත්වයෙන් යුතු ජන සමාජ දක්නට ලැබේ. ශ්‍රී ලාංකික ජන සමාජය ද විවිධ සංස්කෘතීන්ට අයත් ජන කණ්ඩායම්වලින් සමන්විත ය. අපේ ජන සමාජයේ සිංහල, දෙමළ, මුස්ලිම් සහ බර්ගර් වැනි විවිධ ජන වර්ග ජීවත් වෙති. එම ජනවර්ගවලට අයත් පුද්ගලයෝ බෞද්ධ, හින්දු, කතෝලික, ඉස්ලාම් වැනි ආගම් අදහති. සිංහල, දෙමළ, ඉංග්‍රීසි ආදි භාෂා ව්‍යවහාර කරති. ඇතැම් විට එකම භාෂාවක් ව්‍යවහාර කරන්නන් අතර ද පවතින ඇදහිලි හා විශ්වාස විවිධ ය. එමෙන්ම පුද්ගලයින් නිරත වන ජීවනෝපාය, ජීවත් වන ප්‍රදේශය අනුව ද සංස්කෘතික විවිධතා නිරූපණය වේ.

රටක සංස්කෘතික විවිධත්වයකින් යුතු ජන සමාජයක් ඇති වීමට විවිධ හේතු බලපායි. භූගෝලීය පිහිටීම, රටක සංස්කෘතික විවිධත්වයට හේතුවන ප්‍රධාන සාධකයකි. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම, ඉන්දියාවට ආසන්නයේ පිහිටීම වැනි භූගෝලීය සාධක සංස්කෘතික විවිධත්වයක් සහිත සමාජයක් නිර්මාණය වීමට හේතු වී ඇත. විජයාගමනය සහ ඉන් පසුව සිදු වූ මහින්දාගමනය සහ සංඝමිත්තා තෙරණියගේ පැමිණීම වැනි සංස්කෘතික ආගමනයන් අප රටේ බහු සංස්කෘතික ජන සමාජයක් නිර්මාණය වීමට බලපා ඇති හේතු සාධක බව අතීත වංශකථාවලින් පැහැදිලි වේ. එසේම අතීතයේ දී ශ්‍රී ලංකාවට වරින් වර එල්ල වූ ආක්‍රමණ ද සංචාරක, රැකියා, අධ්‍යාපනය වැනි හේතු මත සිදු වූ සංක්‍රමණ ද සංස්කෘතික විවිධත්වයට බලපා ඇත. වෙළඳාම සඳහා මෙරටට පැමිණි අරාබි, ඉන්දියානු, චීන, යුරෝපා වැනි විවිධ ජාතීන් නිසා ද, ආර්ථික භෝග වගාවන් සඳහා බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ශ්‍රමිකයින් ගෙන්වා ගැනීම ද, ශ්‍රී ලාංකික ජන සමාජයේ සංස්කෘතික විවිධත්වය ඇති වීමට හේතු වී තිබේ.



## කණ්ඩායම් ක්‍රියාකාරකම සඳහා උපදෙස්

- ක්‍රියාකාරකම ආරම්භ කිරීමට ප්‍රථම ඔබේ ගුරුතුමාගේ / ගුරුතුමියගේ උපදෙස් අනුව කණ්ඩායම්වලට බෙදෙන්න.
- පියවර 01 සහ පියවර 02 හි සඳහන් තොරතුරු පදනම් කර ගෙන පහත සඳහන් ශිර්ෂ ඔස්සේ තොරතුරු රැස් කරන්න.
    - සංස්කෘතිය හා සංස්කෘතික අංග
    - සංස්කෘතික අංග තුළින් සංස්කෘතික විවිධත්වය නිරූපණය වන ආකාරය
    - සංස්කෘතික විවිධත්වය ඇති වීමට බලපා ඇති හේතු
- චිත්‍ර / ඡායාරූප / පින්තූර සහිතව, රැස් කරගත් තොරතුරු ඇසුරින් සුදුසු ඉදිරිපත් කිරීමක් කරන්න.( e Presentation / Clip Chart / පොස්ටර් / බිත්ති පුවත්පත්).
- එම ඉදිරිපත් කිරීම් පන්තියේ අනෙක් සිසුන් සමඟ බෙදාහදා ගන්න.





## පළමු ක්‍රියාකාරකම ඇසුරෙන් මා තහවුරු කර ගත් විෂය අත්දැකීම්

■ සංස්කෘතිය

යම්කිසි සමාජයක ජීවත්වන පුද්ගලයින්ගේ අනන්‍යතාව පිළිබිඹු කරන්නා වූ සහ සමාජයකින් සමාජයකට වෙනස් වන්නා වූ සංකේත, අංග ලක්ෂණ සියල්ලෙහිම එකතුව සංස්කෘතිය යි.

■ සංස්කෘතියක මූලික අංග

- භාෂාව
- ආගම
- සාහිත්‍ය හා කලා ශිල්ප
- නීතිරීති
- සිරිත් විරිත්
- ප්‍රතිමාන හා සම්ප්‍රදායන්
- ආහාර පාන
- ඇඳුම් පැලඳුම්
- දැනුම
- ඇදහිලි/විශ්වාස/පුරුදු

■ සංස්කෘතික විවිධත්වය

විවිධ සංස්කෘතින්ට අයත් පුද්ගලයින් එකම සමාජයක් තුළ නියෝජනය වීම යි.

■ සංස්කෘතික විවිධත්වය නිරූපණය වන ආකාරය

- ජනවර්ග
- ආගම
- භාෂාව
- ජීවනෝපාය මාර්ග
- ජීවත්වන ප්‍රදේශය

■ සංස්කෘතික විවිධත්වයට හේතු

- භූගෝලීය පිහිටීම
- ආක්‍රමණ
- සංක්‍රමණ

# ක්‍රියාකාරකම 02
## විවිධ සංස්කෘතින් දැන ගනිමු සහයෝගයෙන් දිවි ගෙවමු

අපේක්ෂිත කුසලතාව : පුරවැසියකු වශයෙන් විවිධත්වයට අනුගතව සංස්කෘතික උරුම හා දයාද සුරකියි.

කාලය : පැය 1 යි





## මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා අත්පත් කරගන්නා දෑ

- ශ්‍රී ලංකාව බහු සංස්කෘතික ජන සමාජයක් බව හඳුනා ගැනීම සංස්කෘතික විවිධත්වයට බලපාන විවිධ හේතු සාධක විමර්ශනය කිරීම
- ශ්‍රී ලංකාවේ එක් එක් වාර්ගික හා ආගමික කණ්ඩායම්වලට අයත් සංස්කෘතික උරුම හා දායාද විමර්ශනය කිරීම
- සංස්කෘතික අනන්‍යතාව මෙන්ම එය ආරක්ෂා කර ගැනීම හා සබැඳි පුරවැසි යුතුකම් වගකීම් ඉටු කිරීමට අනුගත වීම
- ශ්‍රී ලාංකික අනන්‍යතාව නිරූපණය කරන ජාතික සංකේත හඳුනා ගැනීම



## පෙර සූදානම


8 ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපනය විෂය භාර ගුරුතුමිය විසින් පාඩම ආරම්භයේ දී සිසුන් අමතා කරන ලද පැහැදිලි කිරීමක් පහත දැක්වේ. බහු සංස්කෘතික සමාජයක සාමාජිකයකු ලෙස කටයුතු කිරීමේ දී, මා සතු යුතුකම් සහ වගකීම් එම පැහැදිලි කිරීම ඇසුරින් හඳුනා ගෙන පියවර 01 සඳහා සූදානම් වෙමි

විවිධ ආගම් අදහනු ලබන, විවිධ ජන වර්ගවලට අයත්, විවිධ භාෂා කතා කරන සහ විවිධ සිරිත් විරිත් අනුගමනය කරන පුද්ගලයින් අප ප්‍රදේශයේ මෙන්ම අප රටේ ද ජීවත් වෙනවා

ඒ නිසා අප රට බහු සංස්කෘතික ජන සමාජයක් ලෙස හඳුන්වන්න පුළුවන් සංස්කෘතියෙන් වෙනස් වුණත් ඔවුන් සාමකාමීව, සහජීවනයෙන් එකම පවුලක සාමාජිකයන් ලෙස එක්ව ජීවත් වෙනවා.

ඒ අනුව අප රටේ පුරවැසියන් අතර එකමුතුකම, සහෝදරත්වය සහ අන්‍යෝන්‍ය විශ්වාසය තහවුරු වී පවතිනවා එය තවදුරටත් වර්ධනය කොට පවත්වාගෙන යාම අනාගත පුරවැසියන් වන ඔබ සියලු දෙනාගේ යුතුකමක් මෙන්ම වගකීමක් වෙනවා.

බහු සංස්කෘතික සමාජයක සාමාජිකයෙකු ලෙස ඔබේ යුතුකම් සහ වගකීම් ඉටු කිරීමේ ආරම්භක පියවර පාසල තුළින් ක්‍රියාත්මක කළ යුතුයි









## බහු සංස්කෘතික සමාජයක සුවිශේෂතා නිරූපණය කරමු



### පොදු උපදෙස්

- බහු සංස්කෘතික සමාජයක සුවිශේෂතා නිරූපණය කිරීම සඳහා සුදුසු දිනයක් ගුරුතුමා/ගුරුතුමිය සමඟ සාකච්ඡා කර යොදා ගන්න.
- සුදුසු පරිදි පන්තිය කණ්ඩායම් කිහිපයකට බෙදෙන්න.
- තම කණ්ඩායමට ලබා දුන් තේමාවට අදාළව සංස්කෘතික සුවිශේෂතා විමර්ශනාත්මකව අධ්‍යයනය කරන්න. (ආගම්, සිරිත් විරිත්, කලා ශිල්ප, දැනුම,චාරිත්‍ර විධි, ඇඳුම් පැළඳුම්, භාෂාව, ආහාර රටා)
- සපයා ගත් තොරතුරු හා ගුරු උපදෙස් පරිදි සංස්කෘතික සුවිශේෂතා නිරූපණය කරන සමරූපණ අවස්ථාව ක්‍රියාත්මක කරන්න.
- ක්‍රියාකාරකම පිළිබඳව සාමූහිකව පසු විපරමක යෙදෙන්න.









## කණ්ඩායම් ක්‍රියාකාරකම සඳහා උපදෙස්

- සංස්කෘතික සුවිශේෂතා සමරුපණයේ දී ඔබ ලබා ගත් සුන්දර මතක සටහන් පහත ආකෘතිය ඇසුරෙන් ප්‍රදර්ශනය කිරීමට සූදානම් වන්න.

- සංස්කෘතික සුවිශේෂතා සමරුපණයේ සුන්දර මතක සටහන්
    - දිනයඃ
    - වේලාවඃ
    - ස්ථානයඃ
    - අත්දැකීම් පිළිබඳ අදහස් (එම අත්දැකීම් ඉදිරිපත් කිරීමේදී ඡායාරූප/චිත්‍ර හෝ වාචික ප්‍රකාශන ලෙස ඉදිරිපත් කල හැකිය)

- ගුරුතුමා/ගුරුතුමියගේ මඟ පෙන්වීම් අනුව "මගේ සුන්දර මතක සටහන්" ප්‍රදර්ශනයේ සෙසු සඟයින් ඉදිරිපත් කර ඇති මතක සටහන් හොඳින් නිරීක්ෂණය කරන්න/කියවන්න.

- ඒ ඇසුරින් පියවර 03 ඇතුළත් පුරවැසි අධ්‍යාපනය පන්ති සඟරාවට ඉදිරිපත් කිරීමට "බහු සංස්කෘතික සමාජයක ජීවත් වීමේදී, එහි සාමාජිකයෙකු ලෙස මගෙන් ඉටු විය යුතු යුතුකම් සහ වගකීම් ඇතුලත් ස්වයං යෝජනාවලිය" යන මැයෙන් තීරු ලිපියක් ලිවීමට සූදානම් වන්න.








## පොදු උපදෙස්

- පහත තේමාවට අදාළව වචන 100 උපරිමයකට යටත්ව තීරු ලිපියක් සකස් කරන්න. එය ඔබගේ ගුරුතුමා/ගුරුතුමියට පෙන්වා සංස්කරණය කොට පුරවැසි අධ්‍යාපනය පන්ති සඟරාවට ඉදිරිපත් කරන්න.

"බහු සංස්කෘතික සමාජයක ජීවත් විමේදි
එහි සාමාජිකයෙකු ලෙස තම සංස්කෘතික අනන්‍යතාව
ආරක්ෂා කරගනිමින් අන් අය සමග කටයුතු කරන ආකාරය"
නිරූපිත යෝජනාවලිය

.......................................................................................................

.......................................................................................................



ගෝලීය සමාජය තුළ ශ්‍රී ලාංකිකයින් ලෙස අප නියෝජනය කරන්නේ
ශ්‍රී ලාංකික අනන්‍යතාවයි.
ශ්‍රී ලාංකික පුරවැසියකු ලෙස එම අනන්‍යතාව ආරක්ෂා කිරීම උදෙසා
නොපිරිහෙලා කටයුතු කිරීම
සෑම පුරවැසියකුගේ ම
යුතුකමක් හා වගකීමක් වනු ඇත.







## ශ්‍රී ලාංකික අනන්‍යතාව තහවුරු කරනු ලබන ජාතික සංකේත සහ ඒවායේ නිරූපිත අර්ථ

| ජාතික සංකේත | නිරූපිත අර්ථ |
|---|---|
| ජාතික කොඩිය | ............................................<br>............................................<br>............................................<br>............................................ |
| රාජ්‍ය ලාංඡනය | ............................................<br>............................................<br>............................................<br>............................................ |
| ජාතික සත්වයා | ............................................<br>............................................<br>............................................<br>............................................ |
| ජාතික වෘක්ෂය | ............................................<br>............................................<br>............................................<br>............................................ |
| ජාතික පක්ෂියා | ............................................<br>............................................<br>............................................<br>............................................ |
| ජාතික ක්‍රීඩාව | ............................................<br>............................................<br>............................................<br>............................................ |

- ජාතික කොඩිය එසවීමේ දී හා වෙනත් භාවිතයන්වලදී අනුගමනය කල යුතු රීති, පිළිවෙළ හා සම්ප්‍රදායන් ඇතුළත් ප්‍රායෝගික අභ්‍යාසයක් ගුරුතුමාගෙ /ගුරුතුමියගේ උපදෙස් හා මග පෙන්වීම් අනුව සිදු කරමු. (පාසල් පුස්තකාලය/ අන්තර්ජාලය වෙතින් 'ජාතික කොඩිය භාවිතය පිළිබඳ රීති සංග්‍රහය' ලබා ගෙන පරිහරණය කරමින් තොරතුරු පසයා ගන්නේ නම් වඩාත් උචිත වේ)

- ජාතික කොඩිය එසවීමේ දී අනුගමනය කල යුතු රීති, පිළිවෙළ හා සම්ප්‍රදායන්
  - ජාතික කොඩිය ඔසවනු ලබන ප්‍රධාන අවස්ථා,
  - තෝරාගත් එක් අවස්ථාවක් සඳහා ජාතික කොඩිය එසවීමට සූදානම් වීම,
  - ජාතික කොඩිය එසවීමේ ක්‍රියාවලිය,
  - නිවැරදි ඉරියව් සහිතව ජාතික ගීය ගායනය,
  - ජාතික කොඩිය පහත හෙළීම/භාර දීම,

- වෙනත් භාවිතයන්වලදී අනුගමනය කල යුතු රීති, පිළිවෙළ හා සම්ප්‍රදායන්
  - ජාතික කොඩිය අඩකුඹු කරන අවස්ථා,
  - අඩකුඹු කිරීමේ හා නැවත පහත හෙළිමේ ක්‍රියා පිළිවෙළ,
  - ගොඩනැගිල්ලක වැනි ස්ථානයක ජාතික කොඩිය ප්‍රදර්ශනය කිරීමේදී අනුගමනය කරන ක්‍රියාමාර්ග,






## තක්සේරු ක්‍රියාකාරකම

- ශ්‍රී ලාංකික අනන්‍යතාව නිරූපනය කරන ජාතික සංකේත, ඒවායේ වැදගත්කම, නිරූපිත අර්ථය, එවා ආරක්ශා කර ගැනීම හා සබැඳි පුරවැසි වගකීම් ඇතුලත් අලංකාරවත් කුඩා පොත් පිංචක් නිර්මාණය කරන්න
    - කරුණුවල ප්‍රමාණවත් බව
    - කරුණුවල නිවැරදි බව
    - අලංකාරවත් බව
    - අවම පිරිවැය
    - කල් පවත්නා ගුණාත්මක නිමාව





## දෙවන ක්‍රියාකාරකම ඇසුරෙන් මා තහවුරු කර ගත් විෂය අත්දැකීම්

- **බහු සංස්කෘතික ජන සමාජය**

විවිධ භාෂා කතා කරන, විවිධ ආගම් අදහන, විවිධ සිරිත් විරිත් අනුගමනය කරන, විවිධ ජනවර්ගවලට අයත් පුද්ගලයින් එකම සමාජයක ජීවත් වීම වේ.


- **බහු සංස්කෘතික ජන සමාජයක සංස්කෘතික උරුම හා දයාද**

  - සංස්කෘතික උරුම හා දයාද එක් එක් සංස්කෘතියට සුවිශේෂ වේ.
  - ඒවා පවතින ස්ථාන, ක්‍රියාත්මක වන සුවිශේෂ අවස්ථා නිවැරදිව හඳුනා ගැනීම, ගරු කිරීම මෙන්ම ආරක්ෂා කර ගැනීම සෑම පුද්ගලයකුගේම යුතුකම හා වගකීම වේ.
  - විවිධ සංස්කෘතික උරුම හා දායාද සුරැකීමේදී ඒවා ආරක්ෂා කර ගැනීම මෙන්ම එම සංස්කෘතික උරුම හා දායාද රැක ගැනීමට ක්‍රියාකාරීව තම සහය ලබා දිය යුතුය.

- **බහු සංස්කෘතික ජන සමාජයක සංස්කෘතික අනන්‍යතාව**

විවිධ සංස්කෘතීන්ගෙන් යුක්ත සමාජයක තම සංස්කෘතියට අයත් උරුම හා දායාද ආරක්ෂා කර ගනිමින් හා අන්‍ය සංස්කෘතීන් වලට අගතියක් නොවන සේ කටයුතු කිරීම වේ.

- **බහු සංස්කෘතික ජන සමාජයක ජාතික සංකේතවලට ගරු කිරීම**
  - ශ්‍රී ලාංකික පුරවැසියකු ලෙස ජාතික සංකේතවලට ගරු කිරීම, ආරක්ෂා කිරීම මෙන්ම ඒවාට හානිදායක වන ක්‍රියාවලින් වැළකීම හා වළක්වා ගැනීම අප සියලු දෙනාගේ ම යුතුකම හා වගකීම වේ.
  - ජාතික සංකේතවලින් ගම්‍ය වන අරුත නිවැරදිව හඳුනා ගැනීම, ඒවා භාවිතයේ දී අනුගමනය කළ යුතු නීති රීති, සම්ප්‍රදායන්වලට අනුගතව කටයුතු කිරීම මෙන්ම අනෙකුත් අය ඒ සම්බන්ධව දැනුවත් කිරීම හා යොමු කිරීම ප්‍රබුද්ධ පුරවැසි භූමිකාවේ ප්‍රධාන වගකීමක් වේ.



# ක්‍රියාකාරකම 03
# සංස්කෘතික දායාද සුරකිමු


අපේක්ෂිත කුසලතාව : සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම හා සබැඳි පුරවැසියකු සතු සමාජ වගකීම් විමර්ශනය කරයි

කාලය : පැය 1 යි



**මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා අත්පත් කරගන්නා දෑ**

- සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමේ පුරවැසි වගකීම විමර්ශනය කිරීම
- සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම





ආදරණීය දුවේ/පුතේ,

ශ්‍රී ලංකාවට උරුම වූ සුවිශේෂී සංස්කෘතික දායාද නිසා ලෝකයේ විවිධ සංස්කෘතීන් ඉදිරියේ, අභිමානවත් ජාතියක් ලෙස නැගී සිටීමේ හැකියාව අපට ලැබී ඇත. අප රට ට උරුම වූ ප්‍රෞඪ සංස්කෘතික දායාදයන් පිළිබඳව දැන ගැනීමෙන් අප තුළ දේශාභිමානී හැඟීම් ජනිත කරයි. සංස්කෘතික දායාද, අපේ අතීත මුතුන් මිත්තන් තුළ රට, දැය, ආගම පිළිබඳව වූ දැනුම, ආකල්ප හා වටිනාකම් මෙන්ම ඒවා නිර්මාණය කිරීමෙහිලා යොදා ගන්නා ලද දේශීය ඥානය ප්‍රතිමූර්තිමත් කරන මාහැඟි සාධක වේ. එසේ අතීතයෙන් උරුම වූ සංස්කෘතික දායාද වර්තමාන සමාජයේ යහජීවන මෙන්ම සහජීවන පැවැත්ම ට මහඟු අනුබලයක් වේ. එබැවින් ශ්‍රී ලාංකික පුරවැසියන් වශයෙන් අප සතු යුතුකම හා වගකීම වනුයේ එම සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමෙන් මතු පරම්පරාවට ඒවා උරුම කර දීමේ ජාතික මෙහෙවරට දායකවීම යි.










සංස්කෘතික දායාදයන්හි වැදගත්කම සහ ඒවා ආරක්ෂා කර ගැනීමට අපට ගත හැකි ක්‍රියාමාර්ග ක්ෂේත්‍ර අධ්‍යයන අත්දැකීම් තුළින් විමර්ශනය කිරීමට පියවර 01 ක්‍රියාකාරකමෙහි නිරත වෙමු



## පොදු උපදෙස්

- ගුරුතුමා /ගුරුතුමිය සමඟ සාකච්ඡා කර ඔබ පාසලට ආසන්න පහසුවෙන් ලඟා විය හැකි සංස්කෘතික වටිනාකම් සහිත ස්ථානයක් හඳුනා ගන්න
- ක්ෂේත්‍ර චාරිකාව සඳහා සුදුසු දිනයක් හා වේලාව විධිමත් පරිදි වෙන් කර ගැනීමට ගුරු උපදෙස් හා සහය ලබා ගන්න. ක්ෂේත්‍ර චාරිකාව සඳහා සුදුසු දිනයක් හා වේලාව විධිමත් පරිදි වෙන් කර ගැනීමට ගුරු උපදෙස් හා සහය ලබා ගන්න
- ක්ෂේත්‍ර චාරිකාවේ දී අධ්‍යයන කාර්යය සාර්ථක කර ගැනීමට සුදුසු නිලධාරින්ගේ සහය ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් ගුරුතුමා /ගුරුතුමිය මගින් කල්වේලා ඇතිව ඔවුන් දැනුවත් කරන්න

  (උදා: පුරා විද්‍යා නිලධාරි/සංස්කෘතික නිලධාරි/ස්ථාන භාර නිලධාරි/ ග්‍රාම නිලධාරි )
- ගුරුතුමා /ගුරුතුමියගේ සහය ඇතිව අධ්‍යයනයේ දී තොරතුරු රැස් කිරීමට සහ වාර්තා කිරීමට සුදුසු දළ ක්ෂේත්‍ර සටහන් ආකෘතියක් සකස් කරන්න
- නියමිත දිනයේ දී ක්ෂේත්‍ර චාරිකාවට පන්තියේ සිසුන් කණ්ඩායම්ගතව සහභාගි වන්න
- ක්ෂේත්‍ර චාරිකාවේ දී ලබා ගන්නා අත්දැකීම් ඇතුළත් දළ සටහන් උපයෝගී කර ගනිමින් පියවර 02 හි දක්වා ඇති ක්ෂේත්‍ර සටහන් පොත සම්පූර්ණ කරන්න




## ක්ෂේත්‍ර සටහන් පොත

**Èkh:** ................................ **wOHhkh l< i|:dkh:** ............................................................

**tu i|:dkfh ixi|lD;sl jeo.;|lu**

**wOHhkhg ,l jqi:dkfh ixiãlD;sl jákdlïj ,g,**

- **ydksiyú we;**
- **ydksiyú ke;**

**udf. kßlIKhg wkqj**

**iyù we;sydks**

**fujeksydksj< lјd .ekß ioyd iyiqlIdud¾. f,i ud bÈßm; lrk fhdckd**

**udf. kÍlIKh wkqj ydks iyú fkdue;, tu i:dkh ;jÿrg; ixj¾Okh lÍug ud bÈßm; lrk fhdckd**




පියවර 01 සහ පියවර 02 ක්‍රියාකාරකම්වල නිරත වීමෙන් ලද අත්දැකීම් ද පදනම් කරගෙන සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම හා සබැඳි පුරවැසි වගකීම් පිළිබඳ සමාජ දැනුවත්බව ඇති කිරීමට නිර්මාණශීලි ලෙස පියවර 03 හි නිරත වෙමු



## තක්සේරු ක්‍රියාකාරකම

- පුරවැසියෙකු ලෙස සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම සඳහා වන සමාජ වගකීම් විමර්ශනය කරමින් වාර්තාමය වැඩසටහනක්/අත් පත්‍රිකාවක් නිර්මාණය කරන්න
- මේ සඳහා අධ්‍යයනයේ දී තොරතුරු වාර්තා කරන ලද ක්ෂේත්‍ර සටහන් පොත හා ලබා ගත් අත්දැකීම් ද පදනම් කර ගන්න
- වාර්තාමය වැඩසටහන/අත් පත්‍රිකාව පහත අන්තර්ගතයන් සහිතව නිර්මාණය කරන්න
    - සංස්කෘතික දායාද
    - සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම
    - පුරවැසියකු ලෙස සංස්කෘතික දායාද ආරක්ෂා කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග
- පහත නිර්ණායකවලට අනුව තක්සේරුව සිදු කරනු ඇත
    - කරුණුවල ගුණාත්මක බව
    - කරුණුවල නිවැරදි බව
    - ආකර්ශනීය වර්ණ හා රූප භාවිතය
    - අවම පිරිවැය
    - ගුණාත්මක නිමාව





## තෙවන ක්‍රියාකාරකම ඇසුරෙන් මා තහවුරු කර ගත් විෂය අත්දැකීම්

- සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම
  - ලෝකයේ විවිධ සංස්කෘතීන් ඉදිරියේ, අභිමානවත් ජාතියක් ලෙස නැගී සිටිමට හැකියාවක් ලැබීම.
  - ප්‍රෞඪ සංස්කෘතික දායාද පිළිබඳව දැන ගැනීමෙන් අප තුළ දේශාභිමානි හැඟිම් ජනිත වීම.
  - අතීතයෙන් උරුම වූ සංස්කෘතික දායාද වර්තමාන සමාජයේ යහජීවන මෙන්ම සහජීවන පැවැත්ම ට මහගු අනුබලයක් වීම.
  - මතු පරම්පරාවට සංස්කෘතික දායාද උරුම කර දීමේ ජාතික මෙහෙවර ඉටු කිරීම පුරවැසි වගකීම් හා යුතුකමක් වීම.

- සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග
  - සමාජය දැනුවත් කිරීම.
  - හානිදායක ක්‍රියාකාරකම් වලින් වැලකීම.
  - හානි කරන පුද්ගලයින් ඉන් මුදවා ගැනීම.
  - හානි පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීම හා ආරක්ෂාව සඳහා සක්‍රියව දායක වීම.



# ක්‍රියාකාරකම 04
# සමාජ වගකීම් ඉටු කරමු

අපේක්ෂිත කුසලතාව :
- සමාජයේ සාමාජිකයකු ලෙස සෑම පුද්ගලයෙකු විසින්ම ඉටුකළ යුතු සමාජ වගකීම විමර්ශනය කිරීම
- පුරවැසියකු ලෙස සමාජ වගකීම් ඉටු කිරීමේ වැදගත්කම හඳුනා ගැනීම
- පාසල් ශිෂ්‍යයකු ලෙස පවුලට, පාසලට සහ පොදු සමාජයට සමාජ වගකීම් ඉටු කිරීම

කාලය : පැය 3 යි



**මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා අත්පත් කරගන්නා දෑ**

- සමාජ වගකීම් හඳුනා ගැනීම
- පුද්ගලයකු සමාජ වගකීම් ඉටුකළ යුතු විවිධ ක්ෂේත්‍ර විමර්ශනය කිරීම
- තමාගෙන් පොදු සමාජයට සමාජ වගකීම් ඉටු කිරීමේ වැදගත්කම අගය කිරීම
- පාසල් ශිෂ්‍යයෙකු ලෙස පවුලට, පාසලට සහ පොදු සමාජයේ උන්නතියට ඉටු කළ හැකි සමාජ වගකීම් ඉටු කිරීම

## පාසලේ උදෑසන රැස්වීමේදී මා විසින් ඉදිරිපත් කළ සිතුවිලි කතාවෙන් කොටසක් පහත දැක්වේ

.............සිතුවිලි කතාව තුළින් මම කතා කරන්න බලාපොරොත්තු වන්නේ පුරවැසියකු ලෙස සමාජ වගකීම් ඉටු කිරීමේ වැදගත්කම පිළිබඳවයි.

සමාජ වගකීම් කියලා කියන්නේ සමාජයේ සාමාජිකයකු ලෙස සෑම පුද්ගලයකු සමාජය වෙනුවෙන් අත්‍යවශ්‍යයෙන්ම ඉටු කළ යුතු කාර්ය භාරයත්, ඒ වෙනුවෙන් ඇති බැඳීමත් කියලා විස්තර කරන්න පුළුවන්. අපි කිසිවකුට, සමාජ වගකීම් වලින් බැහැර වීමට නොහැකියි. සියලු දෙනාම සමාජ වගකීම් ඉටු කිරීමට බැඳී සිටිනවා. එපමණක් නොවෙයි, පුද්ගලයකු ඉටු කළ යුතු සමාජ වගකීම් ක්ෂේත්‍ර ගණනාවක් පවතිනවා තමාගෙන් තම පවුලට, තම පාසලට, තම පරිසරයට, තම ප්‍රදේශයට හා තම මාතෘභමියට වශයෙන් ඒ ක්ෂේත්‍ර පෙන්වා දෙන්න පුළුවන්. එසේනම් පාසල් ශිෂ්‍යයන් වශයෙන් අපි ඉටු කළ යුතු සමාජ වගකීම් පවතින බව ඔබට දැන් හඳුනාගන්න පුළුවන්.

පාසල් ශිෂ්‍යයකු ලෙස තම පවුලට, තම පාසලට හා තම මාතෘභූමියට සමාජ වගකීම් ඉටු කිරීමේ දි එහි වැදගත්කම පිළිබඳවත් අපි අවධානය යොමු කළ යුතු වෙනවා. අපි විසින් ඉටු කරන සමාජ වගකීම් හේතුවෙන් සමාජ සහයෝගිතාව වර්ධනය වීම, සමාජ සහජීවන පුරුදු ස්ථාපිත වීම, පුද්ගල දියුණුව ඇති වීම, පාරිසරික සමතුලිතතාව ඇති වීම ආදිය සිදුවෙනවා.



සිතුවිලි කතාව තුළින්..................

## පුද්ගලයකු ඉටු කළ යුතු විවිධ සමාජ වගකීම් ක්ෂේත්‍ර






ගුරුතුමා/ගුරුතුමිය සමඟ ඉහත ක්ෂේත්‍ර පිළිබඳව සිදු කළ සාකච්ඡාව ඇසුරෙන් පියවර 01හි නිරත වෙමු

මා විසින් මගේ පවුලට වගකීම් ඉටු කළ අවස්ථාවක්

.............................................................................................................

.............................................................................................................

මා විසින් මගේ පවුලට වගකීම් ඉටු කළ අවස්ථාවක්

වගකීම් ඉටු කිරීම තුළින් මා ලද අත්දැකීම හා මට දැනුන/හැඟුන දේ

.............................................................................................................

.............................................................................................................

..........................................................

වගකීම් ඉටු කළ බවට මව/පියා/භාරකරුගේ අත්සන






මගේ පාසලට මගෙන් ඉටු විය යුතු වගකීම් හඳුනා ගනිමින් පියවර 02 හි සතුටින් නියැලෙමු



## පොදු උපදෙස්

- ගුරුතුමා/ගුරුතුමිය සමඟ සාකච්ඡා කර පාසල අලංකාර කිරීම / පාසලේ අවශ්‍යතාව අනුව සුදුසු ශ්‍රමදානයක් සුදානම් කර ගන්න
- ගුරුතුමා /ගුරුතුමිය සහ පාසලේ සියලුදෙනාගේ සහයෝගය සහිතව කාර්යයන් සැලසුම් කරන්න
- ශ්‍රමදාන කාර්යය සාර්ථකව නිම කිරීම සඳහා එක් එක් කණ්ඩායම්වලට සුවිශේෂී වූ වගකීම් පවරා දෙන්න
- නියමිත දිනයේ ශ්‍රමදානයේ නියැලෙන්න

මා විසින් පාසලේ ශ්‍රමදානය ඉටු කළ ආකාරය

..........................................................................................

..........................................................................................

මා විසින් මගේ පාසලට වගකීම් ඉටු කළ අවස්ථාවක්

ශ්‍රමදානය ඉටු කිරීම තුළින් මා ලද අත්දැකීම හා මට දැනුන/හැඟුන දේ

..........................................................................................

..........................................................................................






## මගෙන් සමාජයට ඉටු විය යුතු යුතුකම් හඳුනා ගනිමින් පියවර 03 හි සක්‍රීයව නියැලෙමි



### පොදු උපදෙස්

- ඔබ ජීවත්වන ප්‍රදේශයට සුවිශේෂ වූ යම් සමාජ ගැටලුවක් හඳුනා ගන්න.
- එම ගැටලුව පිළිබඳව ගුරුතුමා/ගුරුතුමිය සමඟ සාකච්ඡා කර එහි ස්වභාවය පිළිබඳව කරුණු අනාවරණය කර ගැනීමට යොමු වන්න.
- තෝරාගන්නා ලද ගැටලුව අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව කණ්ඩායමේ සමාජිකයින් සමඟ සාකච්ඡා කරන්න.
- අනාවරණය කරගත් කරුණු පාදක කරගනිමින් සමාජය දැනුවත් කිරීම සඳහා සුදුසු වැඩසටහනක් සැලසුම් කරන්න.

  (වීදි නාට්‍ය, භූමිකා රංගන, විරිඳු ගායන, පොස්ටර්, බැනර් ආදිය ප්‍රදර්ශනය.......... වැනි)

- වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දෙමාපියන්ගේ සහ අනෙකුත් අවශ්‍ය පුද්ගල සහය ලබා ගැනීමට කටයුතු කරන්න.


**සමාජය දැනුවත් කිරීම සඳහා සුදුසු වැඩසටහනට අදාළ සැලසුමෙහි පියවර**

1 ..........................................................................................................
2 ..........................................................................................................
3 ..........................................................................................................
4 ..........................................................................................................
5 ..........................................................................................................

වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් මා ලද අත්දැකීම හා මට දැනුන/හැඟුන දේ

..........................................................................................................

..........................................................................................................





## සිව්වන ක්‍රියාකාරකම ඇසුරෙන් මා තහවුරු කර ගත් විෂය අත්දැකීම්

- **සමාජ වගකීම්**

සමාජයේ සමාජිකයකු ලෙස සෑම පුද්ගලයකුටම සමාජය වෙනුවෙන් අවශ්‍යයෙන්ම ඉටු කල යුතු කාර්ය භාරය හා ඊට ඇති බැඳීම සමාජ වගකීම් යනුවෙන් හැඳින්විය හැකි ය

- **පුද්ගලයකු සමාජ වගකීම් ඉටුකළ යුතු විවිධ ක්ෂේත්‍ර**
    - තම පවුලට
    - පාසලට
    - පරිසරයට
    - ප්‍රදේශයට
    - මාතෘභූමියට

- **සමාජ වගකීම් ඉටු කිරීමේ වැදගත්කම**
    - පුද්ගල අභිවෘද්ධියක් ඇති වීම
    - සමාජ සහයෝගීතාව ස්ථාපිත වීම
    - සමාජ අභිවෘද්ධිය ඇති වීම
    - පාරිසරික සමතුලිතතාවය ඇති වීම

- පාසල් ශිෂ්‍යයකු ලෙස පවුලට, පාසලට සහ පොදු සමාජයට අදාළව අපට ඉටු කළ හැකි සමාජ වගකීම් රාශියකි අප කිසිවකුටත් මෙම සමාජ වගකීම් වලින් බැහැර විය නොහැකි ය සමාජ වගකීම් ඉටු කරමින් පොදු සමාජයේ උන්නතියට දායක වීම යහපත් පුරවැසියකු ලෙස අප සතු යුතුකමක් හා වගකීමකි

# ක්‍රියාකාරකම 05
# බහු සංස්කෘතිය අගයමින් වැඩ ලෝකයට පිය නගමු


අපේක්ෂිත කුසලතාව : බහු සංස්කෘතික සමාජයක සාමාජිකයෙකු ලෙස වගකීම් සහගත ව රැකියාවේ නිරත වීම සඳහා අත්‍යවශ්‍ය මූලික ගුණාංග ප්‍රගුණ කිරීමේ වැදගත්කම අගය කිරීම

කාලය : පැය 1 යි



## මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා අත්පත් කරගන්නා දෑ

- බහු සංස්කෘතික සමාජයක වැඩලෝකයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමේදී ගොඩනගා ගත යුතු කුසලතා හඳුනා ගැනීම
- ඕනෑම රැකියාවක නිරතවීමේ දී පුද්ගලයකු විසින් ගොඩනගා ගත යුතු අත්‍යවශ්‍ය මූලික කුසලතා හා ගුණාංග අනාවරණය කර ගැනීම
- වැඩ ලෝකය තුළ පවතින ඇතැම් රැකියා සඳහා සුවිශේෂ වෘත්තීය කුසලතා අත්පත් කර ගත යුතු බව විමර්ශනය කිරීම
- සුවිශේෂ රැකියා සඳහා ඉවහල් වන වෘත්තීය මෙන්ම පෞද්ගලික ගුණාංග වැඩි දියුණු කරගත යුතු බව තහවුරු කර ගැනීම








## පොදු උපදෙස්

- කුඩා අවධියේ සිට ම අප සියලු දෙනාට ම අනාගත රැකියාවක් පිළිබඳ සිහිනයක් ඇති අතර එය ඉටුකර ගැනීම අපගේ අපේක්ෂාව යි. ඔබේ අනාගත රැකියා අපේක්ෂා පිළිබඳව මදක් මෙනෙහි කරන්න.
- ඔබේ යහළුවන් අතුරින් පස්දෙනෙකු තෝරා ගෙන ඔවුන් අනාගතයේ දී නිරත වීමට අපේක්ෂා කරන රැකියා මොනවා දැයි අසා දැන ගන්න.
- රැස් කර ගත් තොරතුරු පහත වගුවෙහි ඇතුළත් කරන්න.



### මගේ අනාගත රැකියා අපේක්ෂා

.............................................................................................
.............................................................................................
.............................................................................................
.............................................................................................



### මගේ යහළුවන්ගේ අනාගත රැකියා අපේක්ෂා

1 .............................................................................................
2 .............................................................................................
3 .............................................................................................
4 .............................................................................................
5 .............................................................................................



ඉහත වගුවේ සඳහන් තොරතුරු ඇසුරින් පැහැදිලි වන්නේ වැඩ ලෝකය විවිධ රැකියාවන්ගෙන් සමන්විත වන බව යි.

තම අවශ්‍යතා, රුචිකම් හා ලැදියා සහ හැකියා අනුව අනාගත වැඩ ලෝකයට පිවිසීමේ දී ඔබට විවිධ රැකියා අතුරින් එකක් තෝරා ගත හැකිය.

වැඩ ලෝකය තුළ රැකියාවක නිරත වීමේ දී අපට විවිධ සංස්කෘතීන්ට අයත් පුද්ගලයින් හමු වේ. බහු සංස්කෘතික සමාජ පරිසරයක් තුළ සහයෝග යෙන්, සුහදතාවයෙන් මෙන්ම අවබෝධයෙන් යුතුව කටයුතු කිරීම වැඩලෝකයේ සාර්ථකත්වයට ඉවහල් වේ.

බහු සංස්කෘතික වැඩ පරිසරයක් සහිත ආයතනයක ස්වභාවය පිළිබඳව, 8 ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපනය විෂයභාර ගුරුතුමිය සහ පන්තියේ සිසුන් අතර ඇති වූ සංවාදයක කොටසක් පහත දක්වා ඇත. එය හොඳින් කියවා අවබෝධ කොට ගෙන "බහු සංස්කෘතික සමාජයක වැඩලෝකයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමේ දී ගොඩනඟා ගත යුතු කුසලතා" ලැයිස්තුගත කරන්න.

**ගුරුතුමිය :** හොඳයි දුවේ පුතේ........ දැන් ඔයාලා හැමෝම තමන්ගෙ යහළුවන් අනාගතයේ කරන්න බලාපොරොත්තු වන රැකියා මොනවද කියලා අහලා දැන ගත්තා. ඔයාලව වගේම, මටත් පොඩි කාලේ හීනයක් තිබුණා..... කවදහරි දවසක ගුරුවරියක් වෙනවාමයි කියලා. රැකියාවක් කරන කොට අපිට විවිධ සංස්කෘතීන්වලට අයත් අය සමග එක්ව කටයුතු කිරීමට සිදු වෙනවා. ඒ වගේම, විවිධ මට්ටම්වල රැකියා කරන අය සමග සාමූහිකව හා සහයෝගයෙන් වැඩ කරන්නත් සිදු වෙනවා. අපට වගේම රටටත් සෑම රැකියාවක්ම වැදගත්. ඔය දරුවොත් අනාගතයේ දී වැඩ ලෝකයට පිවිසිමෙන් පසුව කටයුතු කරන්න ඕන ආකාරය පිළිබඳව මම අද දවසේ දී සාකච්ඡා කරන්න තමයි බලාපොරොත්තු වන්නේ..........





**නස්රින් :**

ටීචර්...... අපේ අම්මා වැඩ කරන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ...... සිංහල හා දෙමළ යාළුවෝ ගොඩක් අම්මත් එක්ක වැඩ කරනවා. ඒ අය අපේ ගෙදර එනවා...... අපිත් යනවා. ඒ අයගේ ගෙවල්වල, විශේෂ කෑම බීම සකස් කරපු අවස්ථාවල අපිටත් එවනවා...... අපේ අම්මා සතුටින් තමයි වැඩ කරන්නේ.

**ගුරුතුමිය :**

ඔව්, නස්රින් පුතා බොහොම හොඳ අදහසක් කිව්වේ. දැන් බලන්න..... අපේ පාසලේ දෙමළ භාෂාව උගන්වන රාධා ටීචර්......ඔය දරුවොත් එක්ක වගේම ගුරු මණ්ඩලයත් එක්ක කොතරම් සහයෝගයෙන් කටයුතු කරනවා ද කියලා........ එයා තමයි මගේ හොඳම යාලුවා.

අපි රැකියා කරන ස්ථානයේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් වැනි විවිධ ජනවර්ගවලට අයිති පුද්ගලයින් ඉන්න පුළුවන්. ඒ අය එක්ක එකමුතුව වැඩ කරන්න අපි හැම කෙනෙකුටම පුළුවන් වෙන්න ඕනේ, මට කියන්න, අපේ දේවි දුව......... එහෙම වැඩ කරන්න නම් අපි තුළ ගොඩ නගා ගත යුතු ගුණාංග කිහිපයක්





**දේවි :**

ටීචර්, අපි ගොඩනගා ගත යුතු ගුණාංග තමයි, අවබෝධය, කණ්ඩායම් හැඟීම, ඉවසීම, බෙදා හදා ගැනීම, අන්‍යොන්‍ය ගරුත්වය........, අන් අයගේ සංස්කෘතින්ට ගරු කිරීම.

**ගුරුතුමිය :**

බොහොම හොඳයි, දේවි දුව ඉදිරිපත් කරපු අදහස් හරිම අගෙයි....... හැමෝම අත්පුඩියක් ගහන්න. මීට අමතරව තවත් ගුණාංග තියෙනව ද? පුළුවන් නම් කියන්න.........

ජනුද :

ටීචර්, මට මතක් වෙනවා අපි ඇති කර ගත යුතු තවත් කුසලතා කිහිපයක්........... මම කියන්න ද?

ගුරුතුමිය :

ආ ........... බොහොම හොඳයි........... කියන්න ජනුද පුතා

ජනුද :

විවිධ සංස්කෘතීන් පිළිබඳව දැන ගැනීම හා එම සංස්කෘතික අංගවලට අවස්ථාවෝචිතව අනුගත වීම, විවිධ භාෂා ඉගෙනීම, අන් අයව ගෞරවනීය ලෙස පිළිගැනීම, සාකච්ඡා-වෙන් ගැටලු විසඳා ගැනීම වගේ කුසලතා අපි ගොඩ නගා ගත යුතුයි.





ගුරුතුමිය :

බොහොම හොඳයි..... ජනුද පුතාටත්, හැමෝම අත්පුඩියක් ගහන්න...... දැන් ඔය දරුවන්ට පැහැදිලියි නේද? බහු සංස්කෘතික පරිසරයක ක්‍රියාවක් කරන කොට අපි සියලු දෙනා තුළ ම පැවැතිය යුතු ගුණාංග රාශියක් පවතින බව.......






ආදරණීය දුවේ පුතේ...... ඔය දරුවන් මේ සංවාදය ඇසුරෙන් උගත් කරුණු මෙන්ම විවිධ අයගෙන් අසා දැනගත් තොරතුරු පදනම් කර ගෙන "බහු සංස්කෘතික සමාජයක වැඩලෝකයේ සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීමේ දී ගොඩනඟා ගත යුතු ගුණාංග හා කුසලතා" පහත දැක්වෙන වගු සටහනෙහි ඇතුළත් කරන්න.

බහු සංස්කෘතික සමාජයේ වැඩ පරිසරයක සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමේ දී ගොඩනඟා ගත යුතු ගුණාංග හා කුසලතා

1 ..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................

2 ..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................

3 ..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................

4 ..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................

5 ..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................




## පොදු උපදෙස්



- පියවර 2 යටතේ හඳුනාගත් බහු සංස්කෘතික සමාජයක වැඩ ලෝකයේ සාමාජිකයකු ලෙස වගකීම් සහගතව රැකියාවේ නිරත වීම සඳහා අවශ්‍ය ගුණාංග තෝරා ගත් වැඩ පරිසරයක, ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව සොයා බැලීමට යොමු වෙමු.

  - ඔබ ජීවත් වන ස්ථානයට සමීප බහු සංස්කෘතික වැඩ පරිසරයක් සහිත සේවා ස්ථානයක් තෝරා ගන්න. (පාසල/ නිවස අසල කුඩා ව්‍යාපාරික ස්ථානයක්/කුඩා ඇඟලුම් කර්මාන්තයක් පවත්වාගෙන යන ස්ථානයක්/ වෙනත් සුදුසු ස්ථානයක්)
  - එම ආයතනයේ හිමිකරු/කළමනාකරු/සේවකයෙකු මුණගැසී සම්මුඛ සාකච්ඡාවක් සඳහා තොරතුරු ලබා ගැනීමට පැමිණි බව සැලකරන්න.
  - බහු සංස්කෘතික වැඩ පරිසරයක් තුළ සංස්කෘතික විවිධත්වයට ගරු කරමින් හා සංස්කෘතික විවිධත්වය බාධාවක් කොට නොගෙන කටයුතු කළ හැකි ආකාරය පිළිබඳ තොරතුරු ලබාගන්න.
  - ලබා ගත් තොරතුරු පදනම් කර ගෙන එම ආයතනයෙහි ක්‍රියාත්මක වන බහු සංස්කෘතික සමාජ පරිසර ස්වභාවය පිළිබඳව ඔබේ තක්සේරුව පහත සඳහන් සටහනෙහි දක්වන්න.



## තෝරාගත් ආයතනය වෙත ඉදිරිපත් කෙරෙන ප්‍රශ්නාවලිය

8 ශ්‍රේණිය පුරවැසි අධ්‍යාපනය විෂයයෙහි සංස්කෘතියට අනුගතව වැඩ ලෝකය ජය ගනිමු යන තේමාවට අදාළව "බහු සංස්කෘතිය අගයමින් වැඩ ලෝකයට පිය නගමු"යන ක්‍රියාකාරකමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම උදෙසා මෙම ප්‍රශ්නාවලිය සකස් කර ඇත. පහත දක්වා ඇති තොරතුරු ලබා දෙමින් ඒ සඳහා සහයෝගය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

අධ්‍යයනය සඳහා තොරතුරු රැස් කිරීමට තෝරාගත් ප්‍රදේශය
..............................................................................................................

1 සේවා ස්ථානය (ස්වභාවය): ..........................................................

2 තොරතුරු ලබා දෙන්නාගේ තනතුර: ..................................................

3 ආයතනයේ සේවයෙහි නිරත සේවකයින් සංඛ්‍යාව: ..............................

4 ඔවුන් කුමන ජනවර්ගයකට අයත් ද යන්න :

| ජනවර්ගය | සංඛ්‍යාව |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| මුස්ලිම් | |
| බර්ගර් | |
| වෙනත් | |
| එකතුව | |

5 ඔවුන් කුමන කුමන ආගමකට අයත් යන්න :

| ආගම | සංඛ්‍යාව |
|---|---|
| බෞද්ධ | |
| හින්දු | |
| ඉස්ලාම් | |
| කතෝලික | |
| වෙනත් | |
| එකතුව | |

6 සේවා ස්ථානයේ සංස්කෘතික සුහදත්වය පවත්වාගෙන යන ආකාරය

6.1 සුහදත්වය පවත්වා ගෙන යෑම සඳහා ගෙන ඇති ක්‍රියාකාරකම්

..........................................................................................

..........................................................................................

6.2 සේවා ස්ථානයේ සංස්කෘතික සුහදත්වය වර්ධනය සඳහා ඉදිරිපත් කරන යෝජනා

..........................................................................................

**wdh ; kfhysmj ; lkd**
**nyqixilD;sl ijNdjh ms<slo ; lfiirej**







**tfil ùug fyl;=**

**fhdckd**




අනාගත වැඩ ලෝකයට කුසලතා පූර්ණව පිවිසීමට අවශ්‍ය අත්දැකීම් ගොඩනගා ගනිමු.



## පොදු උපදෙස්

- ඔබේ ගුරුතුමා/ගුරුතුමියගේ උපදෙස් හා මග පෙන්වීම ලබාගෙන තම රැකියා ජීවිතය පිළිබඳ අත්දැකීම් බෙදා හදා ගැනීම සඳහා සම්පත් පුද්ගලයින් තිදෙනෙකුට ආරාධනා කරන්න.
- සුදුසු පරිදි පන්තිය කණ්ඩායම් තුනක් වශයෙන් සකස් කර ගන්න. සාකච්ඡාව සඳහා සුදුසු දිනයක් හා වේලාවක් වෙන් කර ගැනීමට ගුරුතුමා/ ගුරුතුමියගේ සහය ලබා ගන්න.
- සම්පත් පුද්ගලයින් හා සාකච්ඡාවේ නිරතවීමට පහත තේමා ඔස්සේ ප්‍රශ්නාවලියක් සකස් කර ගන්න.
    - අදාළ සම්පත් පුද්ගලයින්ගේ රැකියාව
    - වැඩ පරිසරයේ ස්වභාවය
    - රැකියාවට අදාළව පැවරි ඇති කාර්යභාරය
    - රැකියාවේ නියුක්ත වීමට අවශ්‍ය කුසලතා
    - රැකියාවේ නිරතවීමේදී මුහුණුපෑමට වන අභියෝග
- සම්පත් පුද්ගලයින් සමග සාකච්ඡාවේ නිරතවීම සඳහා පන්තිය සුදුසු පරිදි සකස් කර ගනිමින් දෙපාර්ශවය මුහුණට මුහුණ වන සේ අසුන් ගන්න..

- සාකච්ඡාවේදි මතුවන කරුණු සටහන් කර ගැනීම සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය සපයා ගන්න. කණ්ඩායමකින් එක් අයෙකු බැගින් වන සේ ප්‍රශ්න ඇසීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් පූර්වයෙන් සූදානම් කර ගන්න. දෙනු ලබන පිළිතුරු සෑම කණ්ඩායමක් විසින්ම වෙන් වෙන්ව සටහන් තබා ගන්න.

- සාකච්ඡාව අවසානයේ දි අදාළ සම්පත් පුද්ගලයින්ගේ දායකත්වය අගය කරමින් කෙටි අදහස් දැක්වීමක් සිදු කරන්න. සම්පත් පුද්ගලයින් හා සාකච්ඡාවේ නිරතවීමට පහත තේමා ඔස්සේ ප්‍රශ්නාවලියක් සකස් කර ගන්න.

- එක් එක් සම්පත් පුද්ගලයාගේ අදහස් පිළිබඳව ඔවුන් විසින් ඉදිරිපත් කළ කරුණු ඇසුරින් කණ්ඩායම තුළ සාකච්ඡාවක් පවත්වමින් පොදු එකගතාවක් ගොඩ නගා ගන්න.

- සම්පත් පුද්ගලයින් තිදෙනාගෙන් මතු වූ කරුණු පාදක කරගෙන කණ්ඩායම් තුන අතර නැවත කෙටි සංවාදයක යෙදී කණ්ඩායම් අතර පොදු එකගතාවක් ගොඩනගා ගන්න.

- පොදු එකගතාව ඇසුරින් හඳුනාගත් "රැකියාවක නිරත වීමේ දී පුද්ගලයකු විසින් ප්‍රගුණ කල යුතු මූලික කුසලතා හා ගුණාංග" පහත සටහනෙහි ඇතුළත් කරන්න.

**රැකියාවක නිරත වීමේ දී පුද්ගලයකු විසින්**
**ගොඩනගා ගත යුතු මූලික කුසලතා හා ගුණාංග**

1 ........................................................................
2 ........................................................................
3 ........................................................................
4 ........................................................................
5 ........................................................................
6 ........................................................................




වැඩ ලෝකය තුළ විවිධ රැකියාවල නිරත වීමේ දී සුවිශේෂව අත්පත් කර ගත යුතු කුසලතා විමර්ශනයට කරමු.



## පොදු උපදෙස්

- රැකියා ඇබෑර්තු ඇතුළත් පහත දැන්වීම අධ්‍යයනය කරන්න.
- එක් එක් රැකියාවට සුවිශේෂව පැවතිය යුතු කුසලතා හඳුනා ගෙන අදාළ ස්ථානයෙහි සටහන් කරන්න.

## ඇබෑර්තු

කොග්ගල අපනයන සැකසුම් කලාපයේ පිහිටි ප්‍රමුඛ පෙලේ අපනයන ආයතනයක් වන අපගේ කර්මාන්ත ශාලාවේ පහත සඳහන් තනතුරු සඳහා සම්බන්ධ වීමට දක්ෂ ක්‍රියාශීලි ඔබටත් අවස්ථාවක්.

### මානව සම්පත් කලමනාකරු (තනතුරු 01)

සුදුසුකම් සහ පලපුරුද්ද

- පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ වෙනත් ඒ සමාන උපාධි පිරිනැමීමේ සුදුසුකම් සහිත ආයතනයකින් ලබා ගත් මානව සම්පත් කලමනාකරණය පිළිබඳ විශේෂ උපාධිය සමඟ,
- මානව සම්පත් කලමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ මානව සම්පත් කලමානාකරණය පිළිබඳ වරලත් ආයතනයක සාමාජිකත්වය
- පිළිගත් දේශිය හෝ විදේශිය ආයතනයක මානව සම්පත් කලමනාකරණය පිළිබඳ වසර තුනක සේවා පළපුරුද්ද.
- ඉංග්‍රිසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව.
- පරිගණක භාවිතය පිළිබඳ මනා පළපුරුද්ද.
- වයස අවුරුදු 35ට අඩු වීම.

### විදුලි කාර්මික සහ වැද්දුම්කරුවන් (තනතුරු 02)

සුදුසුකම් සහ පලපුරුද්ද

- ඉංග්‍රිසි භාෂාව, ගණිතය ඇතුළුව අ.පො.ස.(සා.පෙළ) විභාගය විෂයන් හයකින් සමත්ව තිබීම.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කීරීමේ අධිකාරිය (NAITA ) මගින් පවත්වන හෝ ඒ සමාන පිළිගත් ආයතනයකින් ලබා ගත් තුන් අවුරුදු ඩිප්ලෝමා සහතිකය.
- වසර දෙකක සේවා පළපුරුද්ද.
- නවීන යන්ත්‍රෝපකරණ ස්ථාපනය කිරීම, නඩත්තු කිරීම සහ දෝෂ නිවැරදි කිරීමේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වීම.
- පරිගණක හැසිරවීමේ හැකියාව.
- වයස අවුරුදු 40ට අඩු වීම.

ඔබගේ අයදුම් පත්‍රය පහත සඳහන් ලිපිනයට මෙම දැන්වීම පළ වී දින 7 ක් ඇතුළත යොමු කරන්න.

ජ්‍යෝෂ්ඨ මානව සම්පත් කළමනාකරු,
සීමාසහිත සිංහසිංහ (පුද්) සමාගම,
අපනයන සැකසුම් කලාපය,
කොග්ගල.

| සුවිශේෂ කුසලතා | |
|---|---|
| මානව සම්පත් කළමනාකරු | විදුලි කාර්මික සහ වැද්දුම්කරුවන් |
| ............................................... ............................................... | ............................................... ............................................... |


අනාගතයේ නියැලීමට අපේක්ෂිත රැකියාව සඳහා
මවිසින් සපුරා ගත යුතු විශේෂ සුදුසුකම්

1. ...............................................
4. ...............................................
2. ...............................................
5. ...............................................
3. ...............................................
6. ...............................................



### පස්වන ක්‍රියාකාරකම ඇසුරෙන් මා තහවුරු කර ගත් විෂය අත්දැකීම්

- බහු සංස්කෘතික සමාජයක වැඩලෝකයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමේදී ගොඩනගා ගත යුතු කුසලතා.
  - අනන්‍ය සංස්කෘතීන් පිළිබඳ අවබෝධය,
  - කණ්ඩායම් හැඟීම,
  - ඉවසීම,
  - බෙදා හදා ගැනීම,
  - අන්‍යෝන්‍ය ගරුත්වය,
  - අන් අයගේ සංස්කෘතින්ට ගරු කිරීම,
  - විවිධ භාෂාවන්, සංස්කෘතීන් පිළිබඳව දැන ගැනීමට හා ඉගෙනීමට ඇති කැමැත්ත,
  - අන් අයව ගෞරවණීය ලෙස පිළිගැනීම,
  - සාකච්ඡාවෙන් ගැටලු විසඳා ගැනීම,
  - පුද්ගල ජීවිතය හා පෞද්ගලික ජීවිතය සමබරව පවත්වාගෙන යාම,
  - වෘත්තියට අවශ්‍ය දැනුම කුසලතා යාවත්කාලීන කරගැනීම,



- රැකියාවක නිරත වීමේදී පුද්ගලයෙක් විසින් ගොඩනගා ගත යුතු අත්‍යවශ්‍ය මූලික කුසලතා ගුණාංග.
    - වගකීම් සහගතව රැකියාවේ නිරත වීම,
    - වෙලාවට සේවා ස්ථානයට පැමිණීම සහ රැකියාවේ නිරත වීම,
    - කැපවීම,
    - අවංකබව,
    - රැකියාවට ආදරය කිරීම,
    - ධනාත්මක ආකල්ප,
    - පුද්ගල ජීවිතය හා පෞද්ගලික ජීවිතය සමබරව පවත්වාගෙන යාම,
    - වෘත්තියට අවශ්‍ය දැනුම කුසලතා යාවත්කාලීන කරගැනීම,
    - පුද්ගල ජීවිතය හා පෞද්ගලික ජීවිතය සමබරව පවත්වාගෙන යාම,
    - වෘත්තියට අවශ්‍ය දැනුම කුසලතා යාවත්කාලීන කරගැනීම,

- පෞද්ගලිකව වැඩි දියුණු කර ගත යුතු ගුණාංග
    - කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම
    - විවිධ භාෂාවන් හැසිරවීමේ හැකියාව
    - නායකත්ව ලක්ෂණ ප්‍රගුණ කිරීම
    - උසස් පෞරුෂ ගති ලක්ෂණ විද්‍යමාන වීම
    - නවීන තාක්ෂණ භාවිතය හැකියාව

- වැඩ ලෝකයේ පවතින සුවිශේෂී රැකියා සඳහා කුසලතා හා ගුණාංග අවශ්‍ය වන අතර ඒවා අඛණ්ඩව සංවර්ධනය කර ගනිමින් පවත්වා ගත යුතු යි

# ක්‍රියාකාරකම 06
# 21 වන සියවසට ඔබින වැඩ ලෝකයට අනුගත වෙමු

අපේක්ෂිත කුසලතාව : 
- 21 වන සියවසට ඔබින වැඩ ලෝකය හා සබැඳි කුසලතා සංවර්ධනය කර ගැනීම
- වැඩ ලෝකයට සාර්ථකව අනුගතවීම සඳහා ස්වයං ගොනුවක් අඛණ්ඩව සහ යාවත්කාලීන ව පවත්වා ගැනීම

කාලය : පැය 2 යි



**මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා අත්පත් කරගන්නා දෑ**

- 21 වන සියවසේ වෘත්තිකයෙකු සතු විය යුතු කුසලතා විමර්ශනය කිරීම
- යාවත්කාලීන පෞද්ගලික ගොනුවක් සැකසීම
- පෞද්ගලික ගොනුවක් පවත්වා ගෙන යාමේ වැදගත්කම අවධාරණය කර ගැනීම



21වන සියවසෙහි වැඩ ලෝකය විවිධත්වයෙන් යුතු රැකියාවන්ගෙන්/ වෘත්තීන්ගෙන් සමන්විත වේ. ගෝලීය සමාජයේ නව රැකියා හා වෘත්තීය අවස්ථා සඳහා යොමුවන වෘත්තිකයා ඊට අවැසි කුසලතා සංවර්ධනය කර ගත යුතුව ඇත.








## පොදු උපදෙස්

- 21 වන සියවසේ වැඩ ලෝකයේ පවතින නව රැකියා/වෘත්තීන් අන්තර්ජාලය හෝ වෙනත් මූලාශ්‍ර පරිහරණය කරමින් හඳුනාගෙන පහත සටහනෙහි දක්වන්න

### 21 වන සියවසේ පවතින නව රැකියා / වෘත්තීන්

- [ ] ____________________
- [ ] ____________________
- [ ] ____________________
- [ ] ____________________
- [ ] ____________________
- [ ] ____________________
- [ ] ____________________
- [ ] ____________________




ඔබ සඳහන් කළ නව රැකියා/වෘත්තීන්ට අනුව, 21වන සියවසට අයත් වැඩලෝකය සාම්ප්‍රදායික රැකියා ක්ෂේත්‍රවලින් මෙන්ම නූතන තාක්ෂණය හා බැඳුණු රැකියාවන්ගෙන් ද සමන්විත වේ. එවැනි රැකියාවන්ගෙන් සමන්විත නූතන වැඩ ලෝකයට අවැසි කුසලතා සංවර්ධනය කර ගනු ලබන්නේ කෙසේදැයි විමසා බලමු.

කපිල හේමන්ත කුඩා කල සිටම නව මාවතකට යොමු වීම සඳහා උත්සාහ ගත් අයෙකි. කෘෂිකර්මාන්තයෙන් ජීවිකාව කරගෙන ගිය කපිල ගේ පියා ඔහුට ඉගෙනීම සඳහා අවශ්‍ය අතහිත ලබා දුන්නේ බොහෝ දුෂ්කරතා මධ්‍යයේ ය. දක්ෂ කථිකයකු ලෙස පාසල පුරා කීර්තියක් දිනා ගැනීමට කුඩා කපිල සමත් විය. පාසල් පුස්තකාලය ඔහුගේ ජීවිත අඩිතාලම දැමීමට මෙන්ම භාෂා නිපුණත්වයෙන් යුතු පුද්ගලයකු බවට පත් කිරීමට ලබාදුන් මෙහෙය අපමණය. පාසලේ දී ඉංග්‍රීසි හා දෙවන භාෂාව වන දෙමළ බස ඉගෙනීමට ඔහුට අවස්ථාවක් ලැබුණි. එසේම සාමාන්‍ය පෙළ වන විට ඔහු ඉංග්‍රීසි සාහිත්‍ය ද හැදෑරීමට පටන් ගෙන තිබුණි. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි ඔහු තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් වෘත්තීය පාඨමාලාවක් හා සති අන්ත ඉංග්‍රීසි පාඨමාලාවක් හැදෑරීමට පටන් ගත්තේය. සාමාන්‍ය පෙළ විභාගය ඉහළින් සමත් වූ ඔහු උසස් පෙළ විභාගය සඳහා තෝරා ගත්තේ විද්‍යාව අංශයයි. විද්‍යා අංශයේ සිසුවෙක් වුවද නිර්මාණශීලී චින්තනය හොඳින් භාවිත කළ කපිල සිය කාව්‍යමය හැකියාව ප්‍රගුණ කර ප්‍රසිද්ධියට පත්විය. පාසල් බිත්ති පුවත්පත හරහා ඔහු පාසලේ ජනප්‍රිය චරිතයක් බවට පත් විය.

සිය පියා හදිසියේ රෝගාතුර වීම නිසා ජීවිතයේ තමාට එල්ල වූ සෑම අභියෝගයක් ම ජය ගැනීමට අදිටන් කරගත් ඔහු උසස් පෙළ ඉතා ඉහළින් සමත්ව වෛද්‍ය විද්‍යාලයට තේරී පත් විය. වෛද්‍ය විද්‍යාලයට තේරී පත්වූ ඔහු එහිදී මුහුණ පෑමට සිදු වූ දුෂ්කර අවස්ථාවන්ට අනුවර්තනය වූයේ ස්වයං පෙළඹවීමකිනි. නම්‍යශීලී බව ඔහුගේ ජීවිතයට ආභරණයක් විය. මේ නිසා ඔහු වටා මිතුරෝ එක්රැස් වූහ. විශ්වවිද්‍යාල ප්‍රදර්ශනයන් සඳහා සිය මිතුරන් සමඟ නවෝත්පාදන කාර්යයේ නිරත වූ කපිල තම තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව හොඳින් භාවිතයට ගත්තේය.



මේ වන විට ඔහු ඉංග්‍රීසි භාෂාව මැනවින් හසුරුවන්නෙකු බවට පත්ව තිබුණි. පළමු පන්තියේ සාමාර්ථයක් සමඟ විශ්වවිද්‍යාලයේම කථිකාචාර්ය තනතුරක් ලබා ගැනීමට ඔහුට හැකියාව ලැබුණි. වසර කිහිපයක් ගත වූ තැන ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය හිමි කර ගත් ඔහු අදටත් පොතපත පරිහරණය කරන්නේ යාවජීව ඉගෙනුම අත්හැර නොමැති බව ප්‍රකට කරවමිනි. එපමණක් නොව ඵලදායී සන්නිවේදකයෙක් ලෙස නොව වෘත්තීය මාර්ගෝපදේශකයෙක් ලෙස විදෙස් දේශනයන් සඳහා ඔහුට නිතර ඇරැයුම් ලැබේ. ජීවිතයේ කුඩා කල කොපමණ බාධක හමුවේ වුවද ඒවාට හොඳින් අනුවර්තනය වූ කපිල අද වන විට කුසලතා පූර්ණ තෘප්තිමත් වෘත්තිකයකු ලෙස අන් අයට සිය සේවය ලබා දෙයි.

ඉහත සඳහන් සිද්ධිය පදනම් කරගෙන 21 වන සියවසට ඔබින වෘත්තියකයකු සතු විය යුතු කුසලතා පෙලගස්වන්න







පෞද්ගලික ගොනුවක් අඛණ්ඩව පවත්වාගෙන යාම ඵලදායී වෘත්තිකයෙකු වීමට අවශ්‍ය මූලික පදනම ඇති කරන බැවින් පාසල් වියේ සිටම එය නිවැරදිව ඉටු කිරීමේ කුසලතාව සංවර්ධනය කර ගත යුතුය.



## පොදු උපදෙස්

- පහත සඳහන් කරුණු ඇතුළත් වන සේ පෞද්ගලික ගොනුවක් සකස් කර ගනිමු.
    - පෞද්ගලික තොරතුරු
    - පෞද්ගලික ගුණාංග
    - පෞද්ගලික කුසලතා
    - පෞද්ගලික හැකියා හා ලැදියා
    - පාසල තුළ දී හා ඉන් පරිබාහිරව ලබා ගන්නා කුසලතා



# පෞද්ගලික තොරතුරු පිළිබඳ ආකෘතිය

1 සම්පූර්ණ නම :

2 මුලකුරු සමඟ නම :

3 ලිපිනය :

4 පෞද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනය :

5 තැපැල් කේත අංකය :

6 උපන්දිනය :

7 ...........................දිනට වයස :

8 ස්ත්‍රී/පුරුෂ බව :

9 ආගම :

10 ජනවර්ගය :

11 ඉගෙනුම ලබන පාසල :

12 පාසල් වර්ගය හා සංගණන අංකය :

13 ග්‍රාම නිලධාරි වසම සහ අංකය :

14 ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය :

15 පොලිස්බල ප්‍රදේශය :

16 සෞඛ්‍ය බල ප්‍රදේශය :

17 පළාත් පාලන ආයතනයේ නම :
(මහනගර සභා/නගර සභා/ප්‍රදේශය)

18 මව/පියා/භාරකරුගේ නම :

19 දුරකතන අංකය :

20 විද්‍යුත් තැපැල් ලිපිනය :

මාගේ දැනීම අනුව ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික වෙමි




## පෞද්ගලික ගොනුව මට ප්‍රයෝජනවත් විය හැකි අවස්ථා

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................



## හයවන ක්‍රියාකාරකම ඇසුරෙන් මා තහවුරු කර ගත් විෂය අත්දැකීම්

- විසි එක්වන සියවසේ වෘත්තිකයෙකු සතු විය යුතු කුසලතා.
    - ඵලදායි සන්නිවේදනය
    - තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය
    - නිර්මාණශීලී චින්තනය
    - නවෝත්පාදනය
    - නම්‍යශීලී බව
    - යාවජීව ඉගෙනුම
    - භාෂා නිපුණත්වය
    - අනුවර්තන හැකියාව
- පෞද්ගලික ගොනුවක ඇතුලත් විය යුතු තොරතුරු
    - පෞද්ගලික තොරතුරු
    - පෞද්ගලික ගුණාංග
    - පෞද්ගලික කුසලතා
    - හැකියා හා ලැදියා
    - පාසල තුළ දී හා ඉන් පරිබාහිරව ලබාගන්නා කුසලතා
- පෞද්ගලික ගොනුවක් පවත්වාගෙන යාමේ වැදගත්කම
    - වැඩ ලෝකයට සූදානම් වීම සඳහා තමන්ගෙ පෞද්ගලික දක්ෂතා කුසලතා ගොනු කර තබා ගැනීම
    - තමන් පිළිබඳ ස්වයං ඇගයීමක් සිදු කර ගැනීම





